01) පාඩම හෝ ඒකකය - 3.1.2. උත්සව සරසන මනහර පතාක

02) ඉගෙනුම් ඵල -

- විවිධ සංස්කෘතීන්ට අයත් පතාක ලෙලවමින් අරඹන සුවිශේෂී අවස්ථා විස්තර කරයි.
- විවිධ මාධ්‍යයන්ගෙන් නිර්මාණය වූ මනහර පතාක වර්ග භාවිත කරන බව පිළිගනියි.
- අභිමත මාධ්‍යයන් භාවිතයෙන් නිර්මාණය කළ හැකි මනහර පතාක සැලසුම් කරයි.
- මාධ්‍ය භාවිතය, නිර්මාණාත්මක බව, අවස්ථාවට ගැළපෙන බව පිළිබඳ අවබෝධයෙන් මනහර පතාකයක් ඇඳ දක්වයි.
- තම නිර්මාණය රස විඳිමින් අගයයි.


03) ශිෂ්‍යා කළ යුතු කාර්යයන් -

- නිර්මාණාත්මක පතාක යොදා ගනු ලබන අවස්ථා පිළිබඳව වීඩියෝ පට හා ඡායාරූප නරඹන්න.
- පතාක භාවිත වන විවිධ ආගමික හා සංස්කෘතික අවස්ථා පිළිබඳ අවබෝධයක් ලබා ගන්න.
- සාම්ප්‍රදායික පතාකයකට ආදේශකයක් නිර්මාණය කළ හැකි බව වටහා ගන්න.
- පතාකයක් නිර්මාණය කළ හැකි විවිධ අමුද්‍රව්‍ය පිළිබඳ විමසන්න.
- එසේ නිම කළ හැකි පතාකයක් චිත්‍රයක් ලෙස ඇඳීමෙන් නිර්මාණය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබාගත හැකි බව අවධාරණය කර ගන්න.
- තමා අභිමත අයුරින් සැලසුම් චිත්‍ර ඇඳීමට යොමු වන්න.
- මාධ්‍යයන් තෝරාගැනීමේ දී පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරන්න
  - මාධ්‍යයේ සුවිශේෂී බව
  - භාවිතයට සුදුසු හා නුසුදුසු බව හා අදාළ කාර්යයට ගැළපෙන බව
  - ගොඩනැගීමේ පහසුව පිළිබඳ ව සැලකිලිමත් විය යුතු බව
- නිර්මාණය සැලසුම් කිරීමේ දී පහත කරුණු පිළිබඳ ව අවධානය යොමු කරන්න
  - ඉදිරි පෙනුම, පැති පෙනුම පිළිබඳ ව අවධානය යොමු කිරීම
  - අවශ්‍යතාවට ගැළපෙන සේ ගොඩනැගීමට පහසුවන පරිදි සැලසුම් කිරීම
  - තෝරාගන්නා ලද මාධ්‍යයන්ට ගැළපෙන මෝස්තර රටා යොදා ගැනීම
  - එහි සරල බව සහ ප්‍රායෝගික භාවිතයේ දී ගැටලු අවම වීම

- සැලසුම වර්ණ කිරීමේදී පහත කරුණු පිළිබඳ ව අවධානය යොමු කරන්න
  - තෝරාගන්නා ලද මාධ්‍යයට ආවේණික, එහි අනන්‍යතාව තහවුරු වන ලෙස වර්ණ කිරීම
  - ආකර්ෂණීය තත්ත්වය, නැවුම් බව රැකෙන පරිදි මූලික සිද්ධාන්ත භාවිතය
- පාසල ආරම්භ වූ පසු ඔබගේ නිර්මාණ පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.

04) ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කරගත හැකි පොත් පත්, Website,LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක -







- e-තක්සලාව - https://www.e-thaksalawa.mo.go.lk
- e-නැණ පියස - Course : 10 ශ්‍රේණිය චිත්‍ර කලාව - https://www.enenapiyasa.lk
- ගුරු ගෙදර - නැත
- වෙනත් - (YouTube) - https://youtu.be/Nfil_3oUCVQ
  https://youtu.be/DzjUhqi7iY8
  https://youtu.be/Dww3qHvb6aY

05) අතිරේක පොත්/සගරා -

- 10 ශ්‍රේණිය අතිරේක කියවීම් පොත - සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**සැකසුම - නම - කේ.කේ.කේ.එච්.එච්.එච්. පොල්වත්ත.**

**අධ්‍යාපන ආයතනය - කෑ/දෙහි/ නක්කාවිට ක.වි.**

**දෙහිඕවිට අධ්‍යාපන කලාපය**